# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/12 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(22)/73.

මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**වී. ගොපල්ලව,**
ජනාධිපතිවරයා.

1973 ජනවාරි **මස 15** වැනි **දින,**
**කොළඹ දී ය.**

**නියෝග**

1. **මෙම නියෝග** 1973 **අංක** 1 **දරන හදිසි අවස්ථා (බන්ධනාගාර රීති) නියෝග යන නමින් හැඳින්විය හැකිය.**

2. **බන්ධනාගාර ආඥාපනතේ හෝ වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා මේ නියෝග ක්‍රියාත්මක විය යුතුය.**

3. **ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් බන්ධනාගාරයක් විය යුතු යයි ලේකම් විසින් නම් කළ හැකි අතර බන්ධනාගාර ආඥාපනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක කාර්යයන් සඳහා ඒ ස්ථානය එපරිද්දෙන්ම බන්ධනාගාරයක් ලෙස සැලකිය යුතුය.**

4. **බන්ධනාගාර ආඥාපනතේ 94 වැනි වගන්තියේ සඳහන් කරුණු සියල්ල හෝ එයින් කිසිවක් පිළිබඳවත් රීති අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි ලේකම් විසින් සලකා ලබන බන්ධනාගාරවලට හෝ සිරකරුවන්ට සම්බන්ධ වෙන යම් කාරණයක් පිළිබඳවත් ලේකම් විසින් රීති පැනවිය හැකිය.**

5. **මේ නියෝගවල " ලේකම් " යන්නෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අදහස් කෙරෙයි.**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

26/39——ඉක් 18864—2,500 (72/12)